**ශීර්ෂය 281 - ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව**

**-----------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 281 - ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 ජුනි 12 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම.

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කළ සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම.

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව.

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මම ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) මෙම වාර්තාවේ 1.6.1 (අ) **(i)**, **(ii)**, (ඇ) **(i)** ,**(ii)**, **(iii)**, **(iv)**, ඡේදවල සඳහන් නිරීක්ෂණ සම්බන්ධයෙන් ඉකුත් වර්ෂවලදී මා විසින් සිදු කළ නිර්දේශයන් සමාලෝචිත වර්ෂය තුළදීත් ක්‍රියාත්මක කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

**(අ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය.**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | දෙපාර්තමේන්තුවේ පාලන ගිණුමේ හා කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ ශේෂය අතර පැවති රු. 2,301,653 ක වෙනස හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. | දීර්ඝ කාලයක සිට පැවත එන හඳුනා ගත නොහැකි හර ශේෂයන් වන අතර, 2022 වර්ෂයේ දී හඳුනා ගත් ශේෂයන් කිහිපයක් සඳහා ආයතනවලට ලිපි යොමු කර නිරවුල් කර ඇත. ඉදිරියේ දී මෙම වෙනස හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කරන ලෙස අදාළ අංශ දැනුවත් කර ඇත. | වෙනස හඳුනාගෙන නිවැරදි කළ යුතුය. |
| (ii) | 2022 දෙසැම්බර් 31 දිනට අදාළව දෙපාර්තමේන්තුව තුළ ස්ථානමාරු වී ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු රු. 1,991,743 ක ණය ශේෂ 2008 සහ 2009 වර්ෂවල පැණ නැගුණු ණය ශේෂයන් වූ අතර ඒවා 2022 වර්ෂයේදීද නිවැරදිව ගිණුම්වල ගලපා නොතිබුණි. | මෙම ණය ශේෂ 2008, 2009 වර්ෂ අතර අභ්‍යන්තර ස්ථාන මාරු වී ගිය ණය ශේෂ අදාළ වර්ෂයේ සිට ස්ථාන මාරු පැමිණි ණය ශේෂ සමඟ හිලව් කර නිරවුල් කළ යුතු නමුත් මෙම ණය අදාළ වර්ෂයන්හිදී නිවැරදි පරිදි ගිණුම්වලට ගලපා නොමැත. අභ්‍යන්තර ස්ථාන මාරු ගිය ණය ශේෂ අදාළ නිලධාරීන්ගෙන් අයවීමට ඇති ණය ශේෂයක් නොවන අතර මෙය 2008, 2009 වර්ෂයන්හි රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුමේ සිදුව ඇති අභ්‍යන්තර නිරවුල් කිරීමේ දෝෂයක් නිසා ඉතිරිව පවතී. දිස්ත්‍රික් කාර්යාල මගින් කළ විමසීම්වලදී මෙම ණය පිළිබඳ නිශ්චිත තොරතුරක් ලබාගැනීමට නොහැකි වී ඇත. | මෙම ශේෂ නොපමාව නිවැරදි කළ යුතුය. |

**(ආ) දේපළ පිරියත හා උපකරණ**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | 2018 වර්ෂයේදී ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජනායතනයෙන් රාජ්‍ය ජාලගත ව්‍යාපෘතිය යටතේ රු. 3,048,117 ක් වටිනා සන්නිවේදන උපකරණ දෙපාර්තමේන්තුවට පවරාගෙන ඇතත් ඒවායේ වටිනාකම මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයට ඇතුළත් කර නොතිබුණි. | ලංකා රාජ්‍ය ජාල ව්‍යාපෘතිය දෙපාර්තමේන්තුවට ලබාදුන් check point 3200 වර්ගය firewall උපකරණය හා සම්බන්ධව ICTA ආයතනය මගින් නිකුත් කිරීමේ නියෝගයක් හෝ එම උපකරණයේ වටිනාකම පිළිබඳව අප වෙත කිසිදු තොරතුරක් ලැබී නැත. එහෙයින් අදාළ සන්නිවේදන උපකරණය මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශනයට ඇතුළත් වී නොමැති බව දන්වා සිටිමි. | උපකරණ වටිනාකම ICTA ආයතනය මගින් ලබා ගෙන ගිණුම් ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| **(ii)** | 2015, 2018, 2019 සහ 2020 වර්ෂවල අපහරණය කිරීමට තීරණය වූ ඩෝසර් යන්ත්‍ර, බුල් ඩෝසර්, බැකෝ ලෝඩර්, වෛබ්‍රේටින් රෝලර් යන යන්ත්‍රෝපකරණ 14 ක් මු.රෙ. 770 (4) (අ) ප්‍රකාරව අපහරණය කර පොත්වලින් ඉවත් නොකිරීම නිසා මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයේ ඒවායේ වටිනාකම් වැඩියෙන් දක්වා තිබුණි. | අපහරණයට නියමිත යන්ත්‍ර 14 න් යන්ත්‍ර 9 ක් මීන් පෙර තක්සේරු කර වෙන්දේසි කිරීම සඳහා ඉදිරිපත් කළ නමුත් එම යන්ත්‍ර වැඩිම ලංසු ඉදිරිපත් කරන ලද ලංසුකරුවන් විසින් මිලදී නොගත් අතර දැනට අපහරණය සඳහා යෝජිත සියලුම යන්ත්‍ර නැවත තක්සේරු කර වෙන්දේසි කිරීම සඳහා දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන මණ්ඩලය විසින් නිර්දේශ කර ඇත. එම යන්ත්‍ර වෙන්දේසි කිරීමෙන් අනතුරුව මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයෙන් ඉවත් කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | අපහරණ කටයුතු කඩිනමින් සිදුකර පොත්වලින් ඉවත් කිරීමට කටයුතු කළ යුතුය . |
| **(iii)** | පසුගිය වර්ෂයේදී කොම්ප්ට්‍රොලර් ජනරාල් වෙත යවන ලද තොරතුරු වල ඇතුළත් වූ දෙපාර්තමේන්තුව සතු ඉඩම් 178 ක වටිනාකම තක්සේරු කර මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයේ ඇතුළත් කර නොතිබුණි. | දෙපාර්තමේන්තුව සතු තක්සේරු නොකරන ලද අනෙකුත් ඉඩම් තක්සේරු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. අයිතිය තහවුරු නොවූ ඉඩම් වල අයිතිය පවරාගැනීමේ කටයුතු සංවර්ධන අංශය මඟින් දිස්ත්‍රික් මට්ටමින් ප්‍රාදේශීය කාර්යාල හරහා සිදු කිරීමට කටයුතු යොදා ඇත. පවරාගැනීම් කටයුතු සිදු කිරීමේදී අනපේක්ෂිත තත්ත්වයන් හේතුවෙන් විශාල කාලයක් ගතවේ. පවරා ගැනීම් අවසන් වූ වහාම අදාළ වටිනාකම් විධිමත් පරිදි වාර්තා කිරීමට අදාළ අංශ දැනුවත් කර ඇත. | නොපමාව ඉඩම් තක්සේරු කර මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයේ ඇතුළත් කළ යුතුය. |
| **(iv)** | ගබඩා 47 ක්, ගොවිජන සේවා මධ්‍යස්ථාන 137 ක්, වෙනත් ගොඩනැගිලි 19 ක්, කාර්යාල ගොඩනැගිලි 312 ක්, අලෙවිසැල් 23 ක්, නිල නිවාස 30 ක්, සංචාරක බංගලා 05 ක්, ගරාජ් 27 ක්, වෙනත් වාණිජ ගොඩනැගිලි 36 ක්, යාන්ත්‍රික අංගන 03 ක් හා රසායනාගාර හා පර්යේෂණ ගොඩනැගිලි 02 ක් හා ප්‍රධාන කාර්යාලයේ ගොඩනැගිලි 03 ක වටිනාකම තක්සේරු කර මූල්‍ය නොවන වත්කම් යටතේ දක්වා නොතිබුණි. | තක්සේරු කරන ලද ගොඩනැගිලි මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයෙහි ඇතුළත් කර ඇති අතර අනෙකුත් ගොඩනැගිලි තක්සේරු කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. අදාළ තක්සේරු අවසන් වන ගොඩනැගිලි නොපමාව ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව දන්වමි. | සියලුම ගොඩනැගිලි තක්සේරු කර ගිණුම් ගත කළ යුතුය. |
| **(v)** | සමාලෝචිත වර්ෂයේදී මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයට (ඒසීඒ 6) අනුව වර්ෂය තුළ මිලදී ගැනීම්වල වටිනාකමට වර්ෂයේ අලුත්වැඩියා වියදම් රු. 2,755,250 ක් දැක්වීම හේතුවෙන් වර්ෂයේ මිලදී ගැනීම් වටිනාකම එම අගයෙන් වැඩියෙන් දක්වා තිබුණි | 2022 මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශය අනුව වර්ෂය තුළ මිලදී ගැනීම් වටිනාකමෙහි 2021 වර්ෂයේ ගොඩනැගිලි හා ඉදිකිරීම් කෙරී ගෙන යන වැඩ වටිනාකමෙන් නේවාසික නොවන ගොඩනැගිලි හා ඉදිකිරීම් වටිනාකම වෙත මාරු කරන ලද රු. 7,130,126 ක වටිනාකම සහ රත්නපුර දිස්ත්‍රික් කාර්යාලයේ බඹරබොටුව ගොවිජන සේවා මධ්‍යස්ථානයේ අලුත්වැඩියා කටයුතු සඳහා ගොඩනැගිලි පුනරුත්ථාපනය වැය විෂය මඟින් ගෙවීම් කර ඇති රු.2,755,250 ක වටිනාකම ඇතුළත් වේ. CIGAS වැඩසටහනෙහි මෙම වටිනාකම නිවැරදිව 281-2-2-0-2001 වැය විෂය යටතේ ගිණුම් ගත කර ඇති නමුත් මූල්‍ය නොවන වත්කම් ශේෂයට ඇතුළත් වී ඇති අතර එම වටිනාකම මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයෙන් ඉවත් කිරීමට කටයුතු කර ඇත. | වැඩියෙන් සටහන් වූ වටිනාකම් නිවැරදි කර නොමැති බැවින් එම ශේෂය නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| **(vi)** | 2021 දෙසැම්බර් 31 දිනට කොම්ප්ට්‍රෝල ජනරාල් වෙත යවන ලද තොරතුරු අනුව ගොඩනැගිලි වටිනාකම රු. 1,760,597,708 ක් වුවත් ජංගම නොවන වත්කම් සංචරණය පිළිබඳ වාර්තාවේ 2022 ජනවාරි 01 දිනට එම වටිනාකම රු. 842,167,013 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් ගොඩනැගිලි වටිනාකම රු. 918,430,695 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය විසින් තොරතුරු රැස් කිරීමේදී අදාළ මධ්‍යස්ථාන විසින් දිස්ත්‍රික් කාර්යාල වෙත අදාළ ගොඩනැගිලි වටිනාකම් ඉදිරිපත් කරන ලදී. ඉදිරියේ දී විධිමත් පරිදි මෙම වත්කම් මූල්‍ය නොවන වත්කම් ලේඛනයට ඇතුළත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ඇත. | නිවැරදි වටිනාකම ගිණුම් ගත කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **ගොවිජන සේවා මධ්‍යස්ථාන වල හෙළ බොජුන්හල් හා One Stop Shop ඉදිකිරීම.** | | |
| (i) | අංක 118-2-3-20-2509 දරන වැය විෂයය යටතේ රු. 1,399,746 ක් වැයකර පානදුර ගොවිජන සේවා මධ්‍යස්ථානයේ ඉදිකළ හෙළ බොජුන්හලට විදුලිය ලබා නොදීම නිසා 2018 වර්ෂයේ සිට අවභාවිතව පැවතුණි. එසේම 2020 වර්ෂයේදී එහි වැසිකිලියක් සහ One Stop Shop එකක් ඉදිකිරීමට රු. 6,500,000 ක ප්‍රතිපාදනක් ලබා දී තිබුණු අතර 2021 පෙබරවාරි අවසන් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසය වන විට රු. 1,252,852 ක් වැයකර භූමිය සකස් කර වැසිකිලි පද්ධතියට කොන්ක්‍රීට් දමා පාදම පමණක් ඉදිකර තිබුණි. | 2020 වර්ෂයේදි පානදුර One Stop Shop ඉදිකිරිම සඳහා රු. 6,500,000 ක ප්‍රතිපාදන ලබාදුන් අතර ඉන් රු. 1,252,852 ක මුදලක් වැයකර කොන්ක්‍රීට් ආස්තරය මට්ටම දක්වා ඉදිකිරිම් සිදුකර ඇත. අමාත්‍යාංශ ප්‍රතිපාදන ප්‍රමාද වූ බැවින් ඉදිකිරිම් තාවකාලිකව නවතා ඇති අතර ප්‍රතිපාදන ලද පසු කඩිනමින් පානදුර One Stop Shop හි ඉදිකිරිම් ආරම්භ කිරීමට උපදෙස් ලබා දී ඇත. | අඩුපාඩු සකස් කර හෙළ බොජුන්හල සහ One Stop Shop එක නොපමාව පාරිභෝගිකයාට විවෘත කළ යුතුය. |
| (ii) | 2018 වර්ෂයේදී කනන්විල ගොවිජන සේවා මධ්‍යස්ථානයට අනුබද්ධිතව රු. 1,506,720 ක් වැයකර ඉදිකරන ලද හෙළ බොජුන්හල 2023 මාර්තු 31 දින දක්වා ආරම්භ කර නොතිබුණි. | කනන්විල ගොවිජන සේවා මධ්‍යස්ථානයට අනුබද්ධිතව ඉදිකරන ලද හෙළ බොජුන්හල සම්බන්ධව මහජන සෞඛ්‍ය පරීක්ෂක විසින් මහජන සෞඛ්‍යයට හිතකර වන පරිදි වෙනස්කම් කිහිපයක් දැනුම් දී ඇත.එම වෙනස්කම් සිදුකර කඩිනමින් බොජුන්හල විවෘත කිරිමට උපදෙස් ලබා දී ඇත. | නොපමාව හෙළ බොජුන්හල පාරිභෝගිකයාට විවෘත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| **(ආ)** | අංක 198-02-15-002-2506 දරන වැය විෂයය යටතේ ගම සමඟ පිළිසඳරක් යන ව්‍යාපෘතිය මගින් හංවැල්ල නගරයේ හාලි ඇළ ප්‍රතිසංස්කරණය කර මුත්තැස්ස වෙල් යායේ පුරන්ව පැවැති අක්කර 09 ක විශාලත්වයකින් යුත් බෙලිඅත්ත කුඹුර අස්වැද්දීම සඳහා රු.1,200,000 ක ප්‍රතිපාදනයක් සීතාවක ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ලබාදී තිබුණි. එම ප්‍රතිපාදන උපයෝගී කරගෙන අක්කර 05 ක ප්‍රමාණයක් එළිපෙහෙළි කර ඇළ මාර්ගය ඉදිකිරීම සඳහා රු.845,648 ක මුදලක් වැයකර ඇතත් ව්‍යාපෘතියේ අපේක්ෂිත කිසිදු කුඹුරු ප්‍රමාණයක් අස්වද්දා නොතිබුණි. | 2023/24 මහ කන්නයේ මුත්තැස්ස වෙල් යායේ අස්වැද්දීමට සැලසුම් කර ඒ සඳහා ගොවීන් විසින් ලිඛිතව එකඟතාවය ලබා දී ඇත. යල කන්නයේ ප්‍රදේශයට වැටෙන අධික වර්ෂාව හේතුවෙන් ගංවතුර ගැලීම් සිදු වන බැවින් ගොවීන් කුඹුරු වගා කිරීමෙන් වැලකී සිටින අතර මහ කන්නයේ පමණක් මෙම වෙල් යාය වගා කරනු ලබන බව කොළඹ දිස්ත්‍රික් ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස් විසින් දන්වා ඇත. | නොපමාව පුරන් කුඹුරු අස්වැද්දිය යුතුය. |

## 2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | නිරීක්ෂණය | | | | |
|---|---|---|---|---|---|
| | **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **වටිනාකම** | **අනුකූල නොවීම** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
| | | **රු.** | | | |
| (අ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | | |
| (i) | මු.රෙ. 104(1) | 22,219,826 | විනය පරීක්ෂණ අනුව නිලධාරීන් 23 කගෙන් අය කරගත යුතු රු. 22,219,826 ක මුදලක් වර්ෂ 05 සිට වර්ෂ 18 දක්වා කාලයක් ගතවී තිබුණද අය කරගෙන නොතිබුණි. | නීති මඟින් අය කර ගැනීමට කටයුතු යොදා ඇත. වාර්තා නොලද විනය පරීක්ෂණ වාර්තා ලද වහාම ඉදිරි කටයුතු සිදු කිරීමට සැලසුම් කර ඇත. අයවිය යුතු සියලුම මුදල් අයකර ගැනීමට කටයුතු කරමි. | අයවිය යුතු මුදල් නොපමාව අයකර ගත යුතුය. |
| (ii) | මු.රෙ. 104(1)(අ) | | පාඩුවක් හෝ අලාභ හානියක් හෝ සිදු වූ වහාම එහි ප්‍රමාණය හා හේතු නිශ්චය වශයෙන් දැන ගැනීමත් එයට වගකිව යුත්තන් නිශ්චය කිරීමත් සඳහා පරීක්ෂණ ආරම්භ කළ යුතු වුවත් 2019, 2020, 2021 සහ 2022 වර්ෂවලදී සිදුවූ වාහන 08 ක අනතුරු සම්බන්ධයෙන් අදාළ | ඉදිරි කටයුතු කිරීම සඳහා අංක PF-8446 දරන කැබ් රථය විධිමත්ව භාර දී ඇති නිලධාරියා පිළිබඳ තොරතුරුද, අංක PJ-3251 දරන වාහනය අදාළ ලිපි ලද වහාම අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබේ. පරීක්ෂණ මණ්ඩලයක් පත් කර මේ සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු | පරීක්ෂණ කඩිනමින් සිදුකර අලාභය අයකර ගත යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | පරීක්ෂණ සිදු කර නොතිබුණි. | කරන ලෙස අදාළ නිලධාරීන් වෙත උපදෙස් ලබා දී ඇත. | |
| (iii) | මු.රෙ. 104(2) | 978,013 | නැතිවීම් / පාඩු වීම් වටිනාකම රු. 50,000 කට වැඩිනම් ඒ වාර්තාවේ පිටපතක් භාණ්ඩාගාරයේ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත යැවිය යුතු වුවත් රු. 978,013 ක වටිනාකමක් ඇති බවට ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA) විසින් සහතික කළ Checkpoint 3200 වර්ගයේ Firewall උපකරණය අස්ථානගත වීම පිළිබඳව වාර්තාවේ පිටපතක් 2023 මාර්තු 02 දින වන විටත් භාණ්ඩාගාරය වෙත යොමු කර නොතිබුණි. | ලංකා රාජ්‍ය ජාල ව්‍යාපෘතිය මඟින් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත ලබාදුන් check point 3200 වර්ගය firewall උපකරණය හා සම්බන්ධව ICTA ආයතනය මගින් නිකුත් කිරීමේ නියෝගයක් හෝ එම උපකරණයේ වටිනාකම පිළිබඳව අප වෙත කිසිදු තොරතුරක් ලැබී නැත. ඒ හේතුවෙන් මු.රෙ.104 (1) (අ) අනුව කටයුතු කිරීමට නොහැකි විය. එම උපකරණයේ වටිනාකම සොයා ගැනීමටත්, එය නැතිවීම සම්බන්ධවත් ශ්‍රී ලංකා පොලීසිය මඟින් පරීක්ෂණයක් පවත්වා අදාළ වගඋත්තරකරුවන් සහ උපකරණය සම්බන්ධයෙන් තොරතුරු අප වෙත ලබා ගැනීමයි. ඉන්පසුව මු.රෙ.104 අනුව පරීක්ෂණ කටයුතු ආරම්භ කිරීමට කටයුතු කරන ලදී.එම උපකරණය රු.50,000 ට අඩු හෝ වැඩිද යන්න නිගමනය කළ නොහැකි බැවින් මු.රෙ.104(2) ප්‍රකාරව නැතිවීම් හා පාඩුවීම් සම්බන්ධ ව වාර්තා පිටපතක් භාණ්ඩාගාරයේ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත යවා නොමැත. | අලාභයේ වටිනාකම නොපමාව තීරණය කර භාණ්ඩාගාරය වෙත වාර්තා කිරීමත්, අලාභයට වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන අලාභය අයකර ගැනීමටත් කටයුතු කළ යුතුය. |
| (iv) | මු.රෙ. 571 | 5,392,512 | වර්ෂ 02 ඉක්ම වූ තැන්පතු නියාදනය කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පොදු තැන්පත් ගිණුමේ වසර 02 ක් ඉක්මවූ රු. 5,392,512 ක තැන්පතු සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබුණි. | 2022 දෙසැම්බර් 31 දිනට තෙවන පාර්ශවය වෙනුවෙන් ගෙවීම සඳහා රඳවා ගන්නා රු.5,392,512 තැන්පතු අක්මුදල් ලබා ගැනීමේ හැකියාව මත ඉදිරියේ දී නිරවුල් කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | කල් ඉකුත් වූ තැන්පතු මුදල් රෙගුලාසි ප්‍රකාරව නියාදනය කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (v) | මු.රෙ. 880(i) | ගොවිජන සේවා මධ්‍යස්ථාන 565 ක ගොවිජන සංවර්ධන නිලධාරීන් 349 ක්, කමිටු ලිපිකරුවන් 321 ක් සහ කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරුන් 6,374 ක් ඇප තැන්පතු තබා නොතිබුණි. | නිලධාරීන් ඇප තැන්පත් කිරීම සම්බන්ධයෙන් මාර්ගෝපදේශ සංග්‍රහයක් සකස් කර ඇති අතර, අදාළ උපදෙස් ප්‍රකාරව ඇප තැන්පත් කිරීමේ කටයුතු සිදු කරන බව දන්වමි. | ඇප තැන්පත් තැබිය යුතු නිලධාරීන්ගෙන් ඇප තැන්පත් ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (vi) | මු.රෙ. 1647 (ආ) | වාහන සහ උපකරණ පිළිබඳ සමීක්ෂණයන් වර්ෂ 05 කට වැඩි කාලයක සිට සිදුකර නොතිබුණි. | ප්‍රවාහන අංශය විසින් දෙපාර්තමේන්තුව සතු සියලුම වාහන පිළිබඳව දිස්ත්‍රික් කාර්යාලවලින් තොරතුරු ලබා ගෙන සෑම වර්ෂයක් පාසාම වාහන පිළිබඳ සමීක්ෂණ වාර්තාවක් සකස් කරන අතර ඉදිරියේ දී එම වාර්තාව වාර්ෂිකව විගණකාධිපති වෙත ඉදිරිපත් කරනු ලබන බව දන්වමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව වාහන හා උපකරණ පිළිබඳ සමීක්ෂණයක් සිදු කළ යුතුය. |
| (ආ) | **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | | | |
| (i) | 2018 ජනවාරි 24 දිනැති අංක 05/2018(1) දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛය | පුරවැසි /සේවාලාභී ප්‍රඥප්තිය පිළියෙල කර නොතිබුණි. | අදාළ චක්‍රලේඛ ප්‍රකාරව පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය හා මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කර නොමැති බව පිළිගනිමි. එය සකස් කර අවසන් කරන ලෙස අදාළ නිලධාරීන් දැනුවත් කර ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය සකස් කළ යුතුය. |
| (ii) | 2018 ජනවාරි 24 දිනැති 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙළ කර නොතිබුණි. | එය සකස් කර අවසන් කරන ලෙස අදාළ නිලධාරීන් දැනුවත් කර ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙළ කළ යුතුය. |
| (ඇ) | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්-තුවේ 2018 අප්‍රේල් 27 දිනැති අංක 7/2018 දරන දෙපාර්තමේන්-තු චක්‍රලේඛය | ගොවිජන සේවා කාරක සභාවේ,ප්‍රාදේශීය කෘෂිකර්ම කමිටුවේ,දිස්ත්‍රික් ප්‍රාදේශීය ඉංජිනේරුවරයාගේ, දිස්ත්‍රික් තාක්ෂණික කමිටුවේ, දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුවේ සහ කෘෂිකර්ම අමාත්‍යාංශයේ තාක්ෂණික කමිටු නිර්දේශයන් ලබා නොගෙන ගම්පහ | 2011 අංක 46 දරන ගොවිජන සංවර්ධන (සංශෝධන) පනතින් සංශෝධිත 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත ප්‍රකාරව කුඹුරු ඉඩම් වී වගා කිරීමක් හැර වෙනත් කාර්යයක් සඳහා භාවිතා කිරීමට අවසර ලබා දීමේ දී එකී තීරණය ගැනීම සඳහා සලකා බැලිය යුතු බවට | මෙම ඉඩම බී කාණ්ඩයට (වෙනත් බෝග වගා කිරීම පමණක් කළ හැකි) අයත් ඉඩමක් ලෙස එළදා වර්ධන හා අලෙවි අංශයේ |

| | | |
|---|---|---|
| කැප්පෙටියාවත්ත (බුංකිඳ) පර්චස් 226.5 ක් වූ අරලිය ලැන්ඩ්ස් හෝම්ස් පුද්ගලික සමාගමට ව්‍යාපාරික කටයුත්තකට භාවිතා කිරීමට කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුමැතිය ලබාදී තිබුණි. | යෝග්‍ය වන්නේ යැයි ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් විසින් අදහස් කරනු ලබන නිර්දේශ, වාර්තා හා තොරතුරු ලබා ගැනීම සම්බන්ධයෙන් උපදෙස් හා ක්‍රමවේදයන් ඇතුළත් කරමින් 2018.04.27 දිනැති 7/2018 දරන දෙපාර්තමේන්තු චක්‍රලේඛය නිකුත් කර ඇත. විගණන වාර්තාවේ දක්වා ඇති අදාළ ඉල්ලීම පළමුව ප්‍රතික්ෂේප කරන ලද අතර එම සමාගම විසින් නැවත ඉදිරිපත් කරන ලද අභියාචනය සලකා බැලීමට පරීක්ෂණ කමිටුවක් පත් කරන ලදී. එහි නිර්දේශ, දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ඉංජිනේරු නිර්දේශ, මධ්‍යම පරිසර අධිකාරිය විසින් නිකුත් කරන ලද WPO/GQ/08/06/025/2022 හා 2022.03.08 දිනැති ලිපියේ නිර්දේශ, ගොවි සංවිධාන නිර්දේශ ඇතුළුව ඉදිරිපත්ව ඇති සියලු කරුණු සැලකිල්ලට ගැනීමෙන් අනතුරුව විෂයගත කුඹුරු ඉඩම තවදුරටත් වී වගාව සඳහා යොදා ගැනීමට හැකියාවක් නොමැති බැවින් ඉල්ලුම්කරු විසින් ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව, මධ්‍යම පරිසර අධිකාරිය සහ අදාළ අනෙකුත් සියලුම ආයතන වෙතින් අනුමැතිය ලබා ගැනීම ඇතුළු තවත් කොන්දේසිවලට යටත්ව පනත ප්‍රකාරව පැවරී ඇති බලතලවලට අනුව අදාළ අවසරය ලබා දී ඇති බව දන්වමි. | සහකාර කොමසාරිස් විසින් 2022 ජුනි 16 දින පැහැදිලිවම හඳුනාගෙන වාර්තා කර ඇති නිසාත්, චක්‍රලේඛයේ ද ඉතා පැහැදිලිව කුඹුරු යායක් මැද පිහිටි පුරන් කුඹුරක් සහ ජල මූලාශ්‍රයට අදාළ රක්ෂිත කලාපයක පිහිටි පුරන් කුඹුරක් වෙනත් කාර්යක් සඳහා යෙදවිය යුතු නොවන බව දක්වා ඇති හෙයින් මෙම නිවාස සැදීමේ ව්‍යාපෘතිය තහනම් කිරීමටත්, වැරදි සිදුකළ සියලුම නිලධාරීන්ට නීත්‍යානුකූල පියවර ගැනීමටත් කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඈ) | **රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ** 2021 නොවැම්බර් 26 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 2021/03 2.1 වගන්තිය | 2022 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂාත්‍රයෙන් ඉදිරිපත් කළ යුතු වුවත් දෙමළ භාෂාවෙන් ඉදිරිපත් කර නොතිබුණි. | කළමනාකරණය විසින් අදහස් දක්වා නොමැත. | මූල්‍ය ප්‍රකාශනවල දෙමළ පරිවර්තනයක් ඉදිරිපත් කළ යුතුය. |

**2.3 බැංකු ගිණුම් මෙහෙයවීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නිකුත් කර මාස 06 කට වැඩි කාලයක් ගෙවීම් සඳහා ඉදිරිපත් නොවූ රු. 3,112,051 ක් වටිනා චෙක්පත් 336 ක් සම්බන්ධයෙන් මු.රෙ. 396(ඈ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | 2022-12-31 දිනට නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක්පත් 336 ට අදාළ රු.3,112,051 ක මුදල මු.රෙ.396 ප්‍රකාරව කටයුතු කර නිරවුල් කරන ලෙස වගකීම් දරන සියලු නිලධාරීන් වෙත උපදෙස් ලබා දී ඇත. | මුදල් රෙගුලාසි 396(ඈ) ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2022 දෙසැම්බර් 31 දිනට ප්‍රධාන කාර්යාලයේ බැංකු සැසඳුමේ හඳුනා නොගත් ලැබීම් වටිනාකම රු. 1,813,960 ක ශේෂය තුළ චෙක්පත් 11 ක් වූ අතර ඒවා විධිමත්ව හඳුනාගෙන ආදායමට ගෙන නොතිබුණි. | 2022 දෙසැම්බර් 31 දින ප්‍රධාන කාර්යාලයේ බැංකු ප්‍රකාශයට අනුව හඳුනා නොගත් ලැබීම් වලින් චෙක්පත් 11ට අදාළ රු.1,813,960 ක මුදල නිරවුල් කිරීමට කිරීමට කටයුතු කරමින් පවතින බව දන්වමි. | හඳුනා නොගත් ලැබීම් හඳුනාගෙන ආදායමට ගැනීමට කටයුතු කළ යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අංක 281-2-2-12-2506 දරන වැය විෂයය මගින් සුළු වාරිමාර්ග හා පුරන් කුඹුරු සංවර්ධන වැඩසටහන යටතේ මොණරාගල දිස්ත්‍රික් කාර්යාලය රු. 2,495,645 ක් වැය කර සාගිනි වැව ප්‍රතිසංස්කරණ | සාගිනි වැව ව්‍යාපෘතිය ඉදිකිරීම සඳහා රු.4,325,000 ක් ඇස්තමේන්තු කර ඉන් රු.2,495,645 ක ප්‍රතිපාදන 281-2-2-12-2506 වැය ශීර්ෂය මගින් ද රු.1,597,201 ක මුදල ආහාර ප්‍රවර්ධන මණ්ඩලයෙන් ලබාදීමට එකගවී රු.500,000 ක් පමණක් ලබාදී ඇත. ඒ අනුව වැය ශීර්ෂය මගින් ලද ප්‍රතිපාදන මත ප්‍රතිසංස්කරණ | ඉංජිනේරුවරයෙකුගෙන් සමන්විත කමිටුවක් මගින් පරීක්ෂණයක් සිදු කළ යුතුයි. |

| | | |
|---|---|---|
| බිල්පත් සඳහා ඉංජිනේරු සහ තාක්ෂණ නිලධාරිගේ නිම කළ වැඩ සඳහා වූ නිර්දේශ නොමැතිව සහකාර කොමසාරිස්වරයා විසින් ගෙවීම් අනුමත කර ගෙවීම් සිදුකර තිබුණි.ඒ පිළිබඳව සිදුකළ භෞතික පරීක්ෂාවේදී වැව් බැම්ම ඉරිතලා තිබීම, සොරොව්වල දමා තිබුණු කොන්ක්‍රීට් ඉරිතලා තිබීම සහ වැව් පතුළ ජලය වැඩිපුර රැඳෙන ලෙස සකස් කර නොතිබීම වැනි අඩුපාඩු පැවති නිසා භාවිතයට ගත හැකි ආකාරයට වැව ප්‍රතිසංස්කරණය කර නොතිබුණු බව නිරීක්ෂණය විය. | කර තාක්ෂණික නිලධාරී හා ප්‍රාදේශීය ඉංජිනේරු නිර්දේශ සහිත රු.2,494,842 ක බිල්පත් ගෙවීම් කටයුතු සඳහා ඉදිරිපත් කර ඇත. එම ගොනුව විගණනය සඳහා රැගෙන ගොස් තිබුණි. පස්වල ස්වභාවය හේතුවෙන් මතුපිට පස් තට්ටුව පායන කාලයට ඉරිතලා යාමේ ස්වභාවයක් පෙන්නුම් කළද වැව් බැම්මේ පාංශු සම්පිණ්ඩන වාර්තාව සමත් වී ඇත. ඉරිතලා ඇති කොටස ඇස්තමේන්තු නොකරන ලද අමතර කොටස වන අතර ඒ සඳහා ගෙවීම් සිදු කර නොමැත.එම කොටස සොරොව් දොර වෙත ගමන් කිරීම සඳහා ඉදිකරන ලද්දකි. ඉතිරි මුදල වූ රු.1,097,201ක් නොලැබුන බැවින් සැලසුම් කළ පරිදි වැඩ ඵලදායී ලෙස ව්‍යාපෘතිය නිම කිරීමට නොහැකි විය. වැවේ පතුළ ගැඹුරු කිරීමට නොහැකි විය.පසුව ආහාර ප්‍රවර්ධන මණ්ඩලය සමග කරන ලද සාකච්ඡා වලින් පසුව ඉතිරි වැඩ කටයුතු කිරීමට අවශ්‍ය එකඟතාව හා ඉදිරි කටයුතු සිදු කර ඇති බව දන්වමි. | |

## 3.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) වගන්තිය හා 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික කාර්යසාධන වාර්තා පිළියෙල කර ගිණුම් සමඟ විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | 2022 වර්ෂයට අදාළ වාර්ෂික කාර්ය සාධන වාර්තාව සඳහා අංශ මඟින් තොරතුරු කැඳවා සකස් කරමින් පවතින අතර, කඩිනමින් අවසන් කර විගණනය සඳහා ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව දන්වමි. | කාර්යසාධන වාර්තාව ගිණුම් සමඟ ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 12.1 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන හා වාර්ෂික කාර්යසාධන වාර්තා පිළියෙල කර විගණන වාර්තාවද ඇතුළත් කරමින් සියලුම ගණන්දීමේ නිලධාරීන් විසින් වාර්ෂික කාර්යසාධන වාර්තා භාෂාත්‍රයෙන් සකස් කර මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ගතවීමට පෙර පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා ඉදිරිපත් කළ යුතු වුවත් දෙපාර්තමේන්තුවේ 2019, 2020, සහ 2021 වර්ෂවල වාර්ෂික කාර්යසාධන වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කර නොතිබුණි. | 2019, 2020 හා 2021 වර්ෂවල කාර්ය සාධන වාර්තා රට තුළ උද්ගත වූ තත්ත්වය සහ අර්බුද හේතුවෙන් සකස් කිරීමට ප්‍රමාදයක් ඇති වූ අතර, අමාත්‍යාංශ මාරුවීම හේතුවෙන් අනුමැතිය ලබා දීම ද ප්‍රමාද විය. එම වර්ෂවලට අදාළ කාර්ය සාධන වාර්තාවල කටයුතු අවසන් අදියරේ පවතින බැවින් එම කටයුතු අවසන් කර මෙම වර්ෂය අවසන් වීමට පෙර පාර්ලිමේන්තු සභාගත කිරීමට කටයුතු කරන බව දන්වමි. | වාර්ෂික කාර්යසාධන වාර්තා භාෂාත්‍රයෙන් සකස් කර පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතුය. |

## 3.3 විදේශ ආධාර ව්‍යාපෘති

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ වර්ෂාව අඩු කාලවලදී අවම ජල ප්‍රමාණයකින් වගා කිරීමට සහ බලශක්ති අර්බුදයට විසඳුම් ලෙස සූර්ය බලයෙන් ක්‍රියාත්මක වන ජල පොම්ප හා බිංදු ජල තාක්ෂණය යොදා ගැනීම සඳහා 2005 – 2008 වර්ෂවලදී විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත ලබාදුන් රු. 2,327,272,272 ක ප්‍රතිපාදනවලින් ගොවිජන සේවා මධ්‍යස්ථාන 19 කට සූර්යබල සූක්ෂම ජල පද්ධති 7,231 ක් ලබා දී තිබුණි. 2018 වර්ෂය අවසන් වන විට මෙම පද්ධති සඳහා සියලුම මුදල් අයකර අවසන් කළ යුතු බව භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් අමතන ලද 2020 ජූලි 03 දිනැති ලිපිය මගින් තවදුරටත් අයවිය යුතු මුදල රු. 2,264,753,696 ක් බව සඳහන් කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට ලබා දී තිබුණු පද්ධතිවලින් සියයට 90 ක් අස්ථානගතව, අභාවිතව, ගොවීන්ගේ තොරතුරු සොයාගත නොහැකිව සහ අක්‍රීයව පැවතීම නිසා එම ණය ශේෂය අයකර ගත නොහැකි බව ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් විසින් භාණ්ඩාගාරය වෙත දන්වා තිබුණි. | අංක 7/5/19-2021-1 හා 2023.03.23 දිනැති ලිපිය මගින් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට පිටපත් සහිතව ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත දැනුවත් කර ඇත. තිරසාර කෘෂිකර්ම ජල කළමනාකරණ ව්‍යාපෘතියට අදාළ සූර්ය බල ජල සූක්ෂම පද්ධති ස්ථාපනය කිරීමේ වැඩසටහනට අදාළව ගොවිජන සේවා කාරක සභා ගිණුම්වල රඳවාගෙන තිබුණු මුදලින් රු. 5,827,895 ක් කෘෂිකර්ම අමාත්‍යාංශයට යැවීමට අදාළ වාර්තාව යොමු කර ඇත.<br>මෙම වැඩසටහනට අදාළව ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාල හා ගොවිජන සේවා මධ්‍යස්ථාන නිරීක්ෂණයේ දී සහ වාර්තා නිරීක්ෂණයේ දී අනාවරණය වූ කරුණු දක්වා ඇත. | ගිවිසුම් අනුව අයවිය යුතු සියලු මුදල් කඩිනමින් අය කළ යුතු අතර පද්ධති අස්ථානගත වීම සම්බන්ධව පරීක්ෂණයක් පැවැත්විය යුතුය. |
| (ආ) | **ලෝක බැංකු ආධාර යටතේ කොවිඩ් 19 හදිසි තත්ත්වය මත ගබඩා පහසුකම් ඇති කිරීම.**<br>"ආහාර සුරක්ෂිතතාවය සහතික කිරීම හා භෝග අස්වනු සඳහා නිසි මිලක් ලබාගැනීම" පිළිබඳ ජාතික වැඩසටහන යටතේ අතිරේක බෝග සඳහා කෙටිකාලීන ගබඩා පහසුකම් ලබාදීමට ලෝක බැංකු ණය CERS (Contingent Emergency Response Component) යටතේ රු. 223,170,000 ක පිරිවැයක් දරා දිස්ත්‍රික් කාර්යාල 11 ක් ආවරණය වන පරිදි ගබඩා 26 ක් 2021 වර්ෂය අවසානයට නිම කර අවසන් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා ගබඩා 15 ක් ඉදිකිරීම් ආරම්භ කර නොතිබු අතර, ඉදිකිරීම් ආරම්භ කළ ගබඩා 11 න් එක් ගබඩාවක වැඩ අවසන් කර නොතිබුණි. ඉදිකිරීම් අවසන් කරන ලද ගබඩා 10 ම මෙම වාර්තාවේ දිනට අභාවිතව පැවතුණි. | අනෙකුත් ක්ෂේත්‍ර බෝග ගබඩා ඉදිකර අවසන් විය යුතු වන්නේ 2023.03.31 දිනෙන් වන අතර ගබඩා 26 ක් ඉදිකිරීමට යෝජනා වුවද කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් ගබඩා 11ක් පමණක් ඉදිකිරීමට අනුමැතිය ලැබී ඇත. 2022.12.31 දිනට ගබඩා 02 ක වැඩ අවසන් වූ අතර මේ වන විට ඉතිරි ගබඩා 9 ද මේ වන විට වැඩ සම්පූර්ණයෙන් අවසන් වී ඇත. | අතිරේක භෝග ගබඩා කිරීම හෝ එවැනි අවශ්‍යතාවය ක් නොමැති නම් වෙනත් සුදුසු කටයුත්තක් සඳහා උපයෝජනය කළ යුතුය. |

## 3.4 දේශීය අරමුදල් යෙදවූ ව්‍යාපෘති

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සුළු වාරිමාර්ග ප්‍රතිසංස්කරණ හා පුරන් කුඹුරු අස්වැද්දීමේ වැය විෂයයෙන් රු. 5,266,478 ක මුදලක් දුරකථන බිල් පත පියවීම, විදේශ ගමන් අනියම් දීමනා ගෙවීම,කැමරා පද්ධතියක් සවි කිරීම,ශ්‍රවණාගාර පද්ධති ස්ථාපනය කිරීම වැනි වෙනත් වියදම් වෙනුවෙන් උපයෝජනය කර තිබුණි. | ශීර්ෂ ගත කරුණු අනුව ප්‍රමාණවත් පිළිතුරු වාර්තාවක් ඉදිරිපත් කිරීමට නොහැකි අතර එම නිරීක්ෂණ පිළිබඳව සවිස්තර වාර්තාවක් ලබාදෙන්නේ නම් ඒ සම්බන්ධ පැහැදිලි කිරීම් ඉදිරිපත් කිරීමට හැකි බව කාරුණිකව දන්වමි. | ව්‍යාපෘතියට අදාළ ප්‍රතිපාදන ඒ සඳහාම යෙදවිය යුතුය. |

## 3.5 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ලෝක ආහාර ව්‍යාපෘතියෙන් දෙපාර්තමේන්තුවට දී තිබූ CR– 0098 දරන ජීප් රථය 2015 වර්ෂයේ ලියාපදිංචියෙන් පසු භාවිතයෙන් තොරව මාලඹේ රථවාහන අංගනයේ නිෂ්ක්‍රීයව ගාල් කර තිබුණි. | ලෝක ආහාර ව්‍යාපෘතිය මඟින් ලබා දී රේගු ගාස්තු නොගෙවා දිවයිනට ගෙන්වා ඇත. රථය මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචිය සඳහා කොම්ට්‍රෝලර් ජනරාල් මඟින් තීරු බදු ගාස්තු නිදහස් කිරීමට ක්‍රියා කළද එය සාර්ථක නොවුණි. මෙය ඉතා පැරණි රථයක් බැවින් නව රේගු ගාස්තු ගණනය කර දන්වන ලෙස කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම් මඟින් රේගු අධ්‍යක්ෂ ජනරාල්ගෙන් ඉල්ලීමක් කර ඇත. ඒ සඳහා විධිමත් පිළිතුරක් ලද වහාම රථය ලියාපදිංචි කර ගැනීමට අදාළ කටයුතු සිදු කරන බව දන්වමි. | භාවිතයට ගත නොහැකි නම් අපහරණය කළ යුතුය. |
| (ආ) | ගොවිජන සේවා මධ්‍යස්ථාන 25 ක රෝද 04 ට්‍රැක්ටර් 165 ක්, රෝද 02 ට්‍රැක්ටර් 37 ක්, ට්‍රැක්ටර් ට්‍රේලර් 115 ක්, ගොයම් කපන යන්ත්‍ර 77 ක්, තැටි නඟුළු / කොකු නඟුලු 264 ක්, මඩවීල් 350 ක්, සංයුක්ත අස්වනු නෙළන යන්ත්‍ර 19 ක් සහ වෙනත් උපකරණ 720 ක් ආදී වත්කම් වර්ෂ 07 සිට වර්ෂ 25 ක කාලයක සිට අක්‍රීයව, අභාවිතව පැවතිණි. | 2022.12.31 දිනට ගොවිජන සේවා මධ්‍යස්ථාන සතුව පවතින කෘෂි උපාංග අතරින් භාවිතයට ගත නොහැකි මට්ටමේ පවතින කෘෂි උපකරණ අපහරණය සඳහා සූදානම් කර ඇත . | අපහරණය කළ යුතුය. |
| (ඇ) | 2020 මාර්තු දිනැති සමීක්ෂණ මණ්ඩලය මඟින් වෙන්දේසි කිරීමට තීරණය කර තිබුණු වාහන අතරින් 04 ක් වෙන්දේසි නොකර, අලුත්වැඩියා කර නැවත භාවිතා කරන ලෙස 2020 සැප්තැම්බර් 21 දිනැති තක්සේරු මණ්ඩලය විසින් | තක්සේරු මණ්ඩලය විසින් අලුත්වැඩියා කිරීමට යෝජනා කරන ලද වාහන 04 කි.මෙම වාහන අතරින් 32-6627 අංක දරන රථය බදුල්ල දිස්ත්‍රික් කාර්යාලය වෙත ද, 32-7684 අංක දරන රථය ප්‍රධාන කාර්යාලයේ වාහන සංචිතයටද, 51-7033 අංක දරන රථය ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය වෙතද, | රථ වාහන අංගනයේ ඇති මෙම වාහන අලුත්වැඩියා කර භාවිතා |

| | | | |
|---|---|---|---|
| | යෝජනා කර තිබුණද වාහන 02 ක් කිසිදු අලුත්වැඩියාවක් සිදු නොකර මාලඹේ රථ වාහන අංගනයේ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වාම නිෂ්කාර්යව පැවතුණි. | 227-3342 අංක දරන ලොරි රථය අලුත්වැඩියා කර ප්‍රධාන කාර්යාලයේ ලොරි රථ සංචිතයට එක්කොට ඇත. | කළ යුතුය. |
| (ඇ) | 2022 අප්‍රේල් 26 දිනැති අංක 03/2022 දරන ජාතික අයවැය චක්‍රලේඛය අනුව වියදම් දැරීමේදී සහ දේශීය අරමුදල් භාවිතයෙන් සිදුකරන ව්‍යාපෘති කිරීමේදී වැඩ හෝ භාණ්ඩ මිලදී ගැනීම සඳහා (අයවැය යෝජනාද ඇතුළත්ව) ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර ඇති /ආරම්භ කිරීමට නියමිත සියලුම ව්‍යාපෘති තාවකාලිකව අත්හිටුවීමට කටයුතු කළ යුතු බව දක්වා තිබුණද, අංක 281-2-2-0-2103 යටතේ රු.5,902,110 ක් වැය කර කොන්ක්‍රීට් මික්ස්චර් 04 ක්, කොන්ක්‍රීට් පෝකර් මැෂින් 06 ක් හා සොයිල් වයිබ්‍රේටින් හැමර් 06 ක් ඉතා හදිසි කටයුත්තක් ලෙස සලකා 2022 දෙසැම්බර් 28 දින මිලදීගෙන තිබුණි. තවද එම යන්ත්‍රෝපකරණ 2023 ජුනි 15 දින දක්වා ප්‍රයෝජනයට නොගෙන මාලඹේ ගබඩාවේ තබා තිබුණි. | අදාළ යන්ත්‍රෝපකරණ දිස්ත්‍රික් මට්ටමින් සංවර්ධන ව්‍යාපෘති සිදු කිරීමේ අවශ්‍යතාවය මත මිල දී ගෙන ඇති අතර, අදාළ දිස්ත්‍රික්ක වලට බෙදා හැරීමේ කටයුතු කඩිනමින් සිදු කරන බව දන්වමි. | රජයෙන් නිකුත් කරන චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඉ) | මාතලේ සහ මුලතිව් දිස්ත්‍රික් කාර්යාලවල වාහන 08 ක් වර්ෂ 01 සිට වර්ෂ 04 ක කාලයක සිට ධාවනයෙන් ඉවත් කර පැවතුණි. | මෙම වාහන අතරින් වාහන 04 ක් තොරතුරු පහත පරිදි වේ.<br>01. 32-7705 - අලුත්වැඩියා කර ධාවනයට යොදා ගෙන ඇත.<br>02. 32-6603 -වසර 33 ක් පමණ පැරණි අපහරණය කිරීමට යෝජිතව ඇත.<br>03. 32-1469- වසර 35 ක් පැරණි අපහරණය මගින් විකිණීමට යෝජිතයි.<br>04. 57-9438- මෙම රථය වසර 32 ක් පමණ පැරණි අපහරණය මගින් විකිණීමට යෝජිතයි.<br>මෙම වාහන අතුරින් අනෙකුත් වාහන 04 තිරසාර කෘෂිකර්ම ජල කළමනාකරණ ව්‍යාපෘතිය යටතේ ලබා දී ඇති මෝටර් බයිසිකල් වේ. එම මෝටර් බයිසිකල්වල අයිතිය අප දෙපාර්තමේන්තුව සතු නොවන බැවින් අපහරණය කිරීමට හෝ අලුත්වැඩියා කර භාවිතයට ගත නොහැක. ඒ අනුව, අදාළ මෝටර් බයිසිකල්වල අයිතිය දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමට හෝ අයිතිය සතු පාර්ශවයන් වෙත අදාළ මෝටර් බයිසිකල් ලබා දීමට කටයුතු කරන ලෙස අදාළ නිලධාරීන් වෙත උපදෙස් ලබා දී ඇත.\ | අලුත්වැඩියා කර ධාවනයට යොදාගැනීම, අපහරණය කිරීමට කටයුතු කිරීම. අයිතිය දෙපාර්තමේන්තුව වෙත නොමැති වාහන පවරා ගැනීමට හෝ අයිතිය සතු පාර්ශවයන් වෙත අදාළ මෝටර් බයිසිකල් ලබා දීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | මුලතිව් දිස්ත්‍රික් කාර්යාලයේ එකතුව රු. 399,950 ක් වටිනා ඡායා පිටපත් යන්ත්‍ර 02 ක්, පරිගණක 02 ක් හා HP Laser Jet 01 ක් වර්ෂ 03 ක කාලයක සිට නිෂ්ක්‍රීයව හා ඌන උපයෝජිතව පැවතුණි. | විගණන නිරීක්ෂණ සටහන් කර ගතිමි. අදාළ කාර්යාල උපකරණ අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ එසේ හැකියාවක් නොපවතී නම් අපහරණය කිරීමට කටයුතු කරන බව දන්වමි. | මෙම උපකරණ භාවිතයට නොගන්නේ නම් අපහරණය කළ යුතුය. |
| (උ) | ජල කළමනාකරණ අංශයට අත්‍යාවශ්‍ය ලෙස ප්‍රකාශ කර 2019 වර්ෂයේදී මිලදී ගත් එකතුව රු. 25,822,137 ක් වූ පස් කැණීමේ උපකරණ, ජල ප්‍රමිතය මැනීමේ උපකරණ කට්ටලයක්, පස් හැලීම සඳහා අවශ්‍ය පෙනේර, Topcon Auto Level, Aluminum Telescopic Tripod, Soil Auger Set, Current velocity meter උපකරණ මිලදී ගත් දින සිට 2023 මාර්තු 31 දින දක්වා අභාවිතව පැවතුණි. | මෙම උපකරණ අවශ්‍යතා අනුව දිස්ත්‍රික්ක වෙත නිකුත් කිරීමට මෙන්ම ජල කළමනාකරණ පුහුණු කටයුතු සඳහා භාවිතා කරනු ලැබේ. | මෙම උපකරණ භාවිතයට ගත යුතුය. |
| (ඌ) | අංක 281-02-02-12-2506 දරන වැය විෂය යටතේ 2018 වර්ෂයේ කෘෂි ප්‍රදර්ශනවල ජල කළමනාකරණය පිළිබඳ තොරතුරු ප්‍රදර්ශනය කිරීම සඳහා අඟල් 65 Digital Smart UHD LED රූපවාහිනී යන්ත්‍රයක් රු. 500,000 කට සහ අංක 281-02-02-12-2507 දරන පර්යේෂණ හා සංවර්ධන වැය විෂය යටතේ සුළු වාරිමාර්ගවල ගංවතුර තත්ත්වය ප්‍රදර්ශනය කිරීමේ වැඩ පිළිවෙල ක්‍රියාත්මක කිරීම සඳහා පැනසොනික් වර්ගයේ අඟල් 49 LED Display Monitor 04 ක් 2019 පෙබරවාරි 26 දින රු. 701,258 කට මිලදීගෙන ජල කළමනාකරණ අංශය වෙත ලබාදී තිබුණද විගණිත දින වූ 2023 පෙබරවාරි 07 දින වන විටත් අදාළ මිලදීගැනීමේ අරමුණ වෙනුවෙන් එම උපකරණ භාවිතා කර නොතිබුණි. | අඟල් 65 Digital Smart UHD LED රූපවාහිනී යන්ත්‍ර දෙකෙන් 01ක් සහ අඟල් 49 LED Display Monitor යන්ත්‍ර 04 ප්‍රධාන ශ්‍රවනාගාරයෙහි සහ පිළිගැනීමේ අංශය අසල සවිකිරීම සඳහා පාලන අංශය වෙත තාවකාලිකව ලබාදී තිබූ අතර, කොමසාරිස් (මානව සම්පත් සංවර්ධන) ගේ 7/2/1 අංශ සහ 2023.02.13 දිනැති ලිපියට අදාළ කමිටු වාර්තාව අනුව සහ ජල කළමනාකරණ අංශයේ වාර්ෂික වට්ටෝරු භාණ්ඩ සමීක්ෂණය 2022 වාර්තාවට අනුව ස්ථිර ලෙසම මෙම රූපවාහිනී යන්ත්‍ර පාලන අංශය වෙත ලබා දීමට කටයුතු කරන ලෙස දැනුම් දී තිබූ බැවින්, එම යන්ත්‍ර මේ වන විට පාලන අංශය වෙත ලබාදීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී.<br>අනෙක් අඟල් 65 Digital Smart UHD LED රූපවාහිනී යන්ත්‍රය ජල කළමනාකරණ අංශයේ සවිකර ඇති අතර, දියවිතර වාර්තාව ප්‍රදර්ශනය, දෛනික වර්ෂාපතන දත්ත ප්‍රදර්ශනය හා දත්ත පාදම් සකස් කිරීමේ කටයුතු සඳහා මේ වන විට භාවිතා කරනු ලැබේ. | මෙවැනි අනාර්ථික ගනුදෙනු නැවත සිදු නොකළ යුතුය. |
| (එ) | 2012 ජුනි 20 දිනැති DMS/G2/56/01 අංක දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව ලිපිය අනුව චීන රජයෙන් ලබාදුන් යන්ත්‍රෝපකරණ සඳහා වැඩසටහන් නිලධාරීන් 05 ක්, කාර්මික නිලධාරීන් 05 ක් (යාන්ත්‍රික) හා කාර්මික (යාන්ත්‍රික) 08 ක් බඳවා ගැනීමට අවසර ලබාදී තිබියදීත් | චීන රජයෙන් ලබාදුන් සමහර යන්ත්‍ර කොම්බයින් හා වෙස්ටර් ට්‍රැක්ටර් යන්ත්‍ර, ප්‍රයිමුවර් රථය / ඩෝසර් යන්ත්‍ර දෙපාර්තමේන්තු අවශ්‍යතා සඳහා නොගැළපීම මත වෙනත් ආයතන වෙත පවරන ලදි. | අනුමත තනතුරුවලට ස්ථිරව නිලධාරීන් බඳවා ගත යුතුය. |

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා වර්ෂ 10 ක් තුළ එම පුරප්පාඩු පිරවීමට කටයුතු නොකර එම නිලධාරීන් පුහුණු කිරීම සඳහා යාන්ත්‍රික අධිකාරීවරයා (විශ්‍රාමික) සේවය නැවත ලබාගැනීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් ඉල්ලීම් කර තිබුණි.

## 3.6 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුව වෙත 2019 ගිණුම් වර්ෂය සඳහා නිකුත් කළ විගණන විමසුම් 50 ක්ද, 2020 වර්ෂයේ විමසුම් 62 ක්ද, 2021 වර්ෂයේ විගණන විමසුම් 66 ක් සහ සමාලෝචිත වර්ෂයේ නිකුත් කළ විගණන විමසුම් 148 කට 2023 මාර්තු 31 දින දක්වාම පිළිතුරු එවා නොතිබුණි. | දිවයින පුරා විසිරී පවතින ගොවිජන සේවා මධ්‍යස්ථාන 562 කින් හා දිස්ත්‍රික් කාර්යාල 25 මඟින් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව මහජනතාවට සේවා සපයනු ලැබේ. දිස්ත්‍රික් කාර්යාල සහ ගොවිජන සේවා මධ්‍යස්ථාන අදාළ දිස්ත්‍රික්කයේ විගණන අධිකාරී මඟින් විගණනය කර විගණන විමසුම් ඉදිරිපත් කරනු ලබයි. මෙයට අමතරව ප්‍රධාන කාර්යාලයේ රජයේ විගණන අංශය මඟින් ද අදාළ දිස්ත්‍රික් කාර්යාල හා ගොවිජන සේවා මධ්‍යස්ථාන විගණනය කර විගණන විමසුම් යොමු කරනු ලැබේ. මෙසේ ඉදිරිපත් කරන සියලු විගණන විමසුම් වෙනුවෙන් අදාළ පැහැදිලි කිරීම් දිස්ත්‍රික් කාර්යාල හා අදාළ ගොවිජන සේවා මධ්‍යස්ථාන වෙතින් ලබාගෙන පිළිතුරු ගොනු කළ යුතු වේ.<br>සමහර විගණන විමසුම් සඳහා අවශ්‍ය වන පැහැදිලි කිරීම් ලබාගෙන විශ්ලේෂණය කිරීමට ගතවන කාලය පිළිතුරු සැපයීමට ලබා දී ඇති කාලය තුළ ඉටු කිරීම ප්‍රායෝගික නොවේ. එබැවින් නිශ්චිත කාලයක් තුළ පිළිතුරු සැපයීම සමහර අවස්ථාවලදී ප්‍රමාද වීම් දක්නට ලැබේ.<br>කෙසේ වෙතත් මේ වන විට අවසන් පිළිතුරු ලබා දීමට ප්‍රමාද වී ඇති විගණන විමසුම් සඳහා අදාළ පිළිතුරු සකස් කරමින් පවතින අතර, කඩිනමින් පිළිතුරු ලබා දීමට ඇති සියලුම විගණන විමසුම් සඳහා පිළිතුරු ලබා දීමට කටයුතු කරන බව දන්වමි. | නියමිත කාල සීමාව තුළ විගණන විමසුම්වලට පිළිතුරු ලබාදිය යුතුය. |

## 3.7 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2015/2016 වර්ෂවලදී ගොවීන්ගේ භාරකාර අරමුදලින් අනුරාධපුර දිස්ත්‍රික් කාර්යාලය සඳහා බඩඉරිඟු වගා කිරීම වෙනුවෙන් ගොවීන් 5,386 කට මාස 06 කින් අයකර ගැනීමේ පදනමින් රු. 80,790,000 ක් ලබා දී වර්ෂ 05 ක් ගතවී තිබුණද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු මුදල රු. 16,596,395 ක් විය. මෙම ණය මුදලින් ගොවීන් 531 ක් කිසිදු වාරිකයක් ගෙවා නොතිබුණු අතර ණය නොගෙවීම සම්බන්ධයෙන් ගොවිජන විනිශ්චය සභා වෙත යොමුකළ ද අදාළ ණය මුදල් අයවී නොතිබුණි. | 2015/2016 විශේෂ බඩඉරිඟු ව්‍යාපෘතිය යටතේ ගොවීන්ගේ භාරකාර අරමුදලින් අනුරාධපුර දිස්ත්‍රික්කයේ තෝරාගත් ගොවීන් 5386 ක් සඳහා රු. 80,790,000 ක මුදලක් ලබා දී ඇති අතර, එම මුදලින් 2023.05.15 දිනට රු. 64,981,115 අයවී ඇති අතර තවදුරටත් අයවිය යුතු මුදල රු. 15,808,885 කි. | අඛණ්ඩව පසු විපරම් කර කඩිනමින් ණය අය කරගත යුතුය. |
| (ආ) | 2020/2021 වර්ෂවලදී ගොවීන්ගේ භාරකාර අරමුදලින් විශේෂ බඩ ඉරිඟු වගා කිරීම වෙනුවෙන් රු. 200,000,000 ක මුදලක් ලබා දී තිබුණද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට අයවිය යුතු මුදල රු. 13,761,453 ක් (පොලිය හැර) බව නිරීක්ෂණය විය. | 2020/2021 වර්ෂවල ගොවීන්ට බඩඉරිඟු වගා කිරිම සඳහා මෙම අරමුදලෙන් ලබාදුන් මුදලින් රු.13,395,208 ක මුදලක් තවදුරටත් අයවිය යුතුව ඇත. | අඛණ්ඩව පසු විපරම් කර කඩිනමින් ණය අය කරගත යුතුය. |
| (ඇ) | 2020 වර්ෂයේ දී බිත්තර වී ලබා ගැනීම සඳහා ගොවීන්ගේ භාරකාර අරමුදලින් රු. 25,000,000 ක මුදලක් මාස 06 කින් අය කර ගැනිමේ පදනම මත ලබා දී ඇතත් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තව දුරටත් අය විය යුතු මුදල රු. 4,306,145 ක් බව නිරීක්ෂණය විය. | 2020 වර්ෂයේ ගොවීන්ගේ භාරකාර අරමුදලින් බිත්තර වී ලබා ගැනීම සඳහා ලබාදී ඇති රු.25,000,000 මුදලින් 2023.05.17 වන දිනට මහනුවර දිස්ත්‍රික්කයෙන් රු. 2,978,928 ක් හා මාතර දිස්ත්‍රික්කයේ රු.210,000 ක් වේ. ඒ අනුව රු. 3,188,928 ක අයවිය යුතු මුදල කඩිනමින් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පවති. | අඛණ්ඩව පසු විපරම් කර කඩිනමින් ණය අය කරගත යුතුය. |
| (ඈ) | කාබනික පොහොර ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් ක්‍රියාත්මක කළ “සාරලංකා” වැඩසටහන යටතේ 2016, 2017, 2018 වර්ෂවල දිස්ත්‍රික් කාර්යාල 21 ක ගොවීන් 318 ක් වෙනුවෙන් රු. 69,850,000 ක ණය මුදලක් ගොවීන්ගේ භාරකාර අරමුදලින් ලැබී ඔවුන්ට නිකුත් කර තිබුණද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තවදුරටත් අයවිය යුතු මුදල රු. 21,029,067 ක් විය. මෙම ණය මුදල් අයවීම ඉතා දුර්වල මට්ටමක පැවතුණි. | “සාරලංකා” වැඩසටහන යටතේ ගොවීන්ගේ භාරකාර අරමුදල විසින් 2016, 2017 හා 2018 වර්ෂවලදී ගොවීන් වෙත ලබාදුන් මුදලින් 2021 දෙසැම්බර් 31 දිනට අයවීමට පැවති රු.21,029,067 ක මුදලින් 2023 මැයි 15 දිනට රු.3,542,646 ක මුදලක් අය වී ඇති අතර තවදුරටත් රු. 17,486,421ක මුදලක් අයවිය යුතුව ඇත. අයවිය යුතුව පවතින ණය අයකරගැනිම සඳහා වගකිව යුතු සියලු නිලධාරීන් වෙත උපදෙස් ලබා දී ඇත. | අඛණ්ඩව පසු විපරම් කර කඩිනමින් ණය අය කරගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | 2000/2007 කාලය තුළදී වී මිල දී ගැනීමට අත්තිකාරම් ලබාදී ඇති බදුල්ල සහ අනුරාධපුර දිස්ත්‍රික් කාර්යාල වලින් අයකර භාණ්ඩාගාරයට පියවිය යුතු මුදල රු. 12,552,764 ක් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා කටයුතු කර නොතිබුණි. | බදුල්ල සහ අනුරාධපුර දිස්ත්‍රික් කාර්යාල වී මිල දී ගැනීම් සඳහා වූ අත්තිකාරම් මුදල් සම්බන්ධව දිස්ත්‍රික්ක මඟින් වාර්තා කැඳවා ඇති අතර, එම තොරතුරු පදනම් කර ගනිමින් මේ වන විට සාරාංශ වාර්තාව සකසමින් පවතින බැවින් එම කාර්යය අවසන් වූ වහාම රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමට කටයුතු කරන බව දන්වමි. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවට අදාළ ණය මුදල පියවීමට කටයුතු කළ යුතුය |
| (ඊ) | ශ්‍රී ලංකා රාජ්‍ය ජාල ව්‍යාපෘතිය මගින් දෙපාර්තමේන්තුව වෙත ලබා දී තිබුණු රැහැන් රහිත අන්තර් ජාල පද්ධතියට අයත් රු. 978,013ක වටිනාකමක් ඇති බවට ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජනායතනයෙන් (ICTA) විසින් සහතික කළ checkpoint 3200 වර්ගයේ firewall උපකරණය 2020 වර්ෂයේ මාර්තු 15 දින අස්ථානගතවීම සම්බන්ධයෙන් 2022 අප්‍රේල් මස 22 දින ලබා දුන් මූලික විමර්ශන වාර්තාව අනුව එම අලාභය ප්‍රධාන ඉංජිනේරුවරයාගෙන් අයකර ගැනීමට තීරණය කර තිබුණ ද මූලික විමර්ෂණ කටයුතු ප්‍රමාද වීම නිසා විශ්‍රාම වැටුප් සංග්‍රහයේ 2/17 මගින් 2020 නොවැම්බර් 10 දින එම නිලධාරියාව විශ්‍රාම ගන්වා තිබුණි. එමෙන්ම ඔහුට උසස්වීමට අදාළ හිඟ වැටුප් හා විශ්‍රාම නිලධාරීන් නැවත සේවයේ යෙදවීමේදී ගෙවිය යුතු දීමනාව වශයෙන් රු. 1,469,725ක් 2022 දෙසැම්බර් මස ගෙවීම් කිරීමේදී ඉහත අලාභය වෙනුවෙන් අදාළ නිලධාරියාට ගෙවනු ලැබූ මුදල් රඳවා ගැනීම් සිදු කර නොතිබුණි. | විශ්‍රාම වැටුප් සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 43(අ) වගන්තිය යටතේ, විශ්‍රාම ගන්වන ලද නිලධාරියෙකුගෙන් යම් අයකර ගැනීමක් කිරීමට නම් එය විශ්‍රාම වැටුපෙන් අය කරගත යුතුය. එබැවින් ප්‍රභාත් විතාරණ මහතාට හිමිව තිබුණු හිඟ වැටුපෙන් අයකර ගැනීමේ අධිකාරී බලයක් දෙපාර්තමේන්තුව සතුව නොමැත. තවද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අංක 13 හි 05 වන වගන්තිය යටතේ වරදකරු යැයි ඔප්පු කරන ලබන තෙක් සෑම තැනැත්තෙකුම නිර්දෝශී යැයි පූර්වානුමාන කළ යුත්තේය. ප්‍රභාත් විතාරණ මයා මූලික විමර්ශන වාර්තාව අනුව නිලධාරියෙකු වැරදිකරුවෙකු කළ නොහැකි අතර ඒ සඳහා විධිමත් විනය පරීක්ෂණයක් මගින් නිලධාරියා වැරදිකරුවෙකු වීම සිදුවිය යුතුය. ඒ අනුව වැරදිකරු බවට ඔප්පු නොවූ නිලධාරියාගෙන් අදාළ අයකර ගැනීමක් සිදු කළ නොහැක. නිලධාරියා විශ්‍රාම ගැන්වීම සඳහා අනුමැතිය ලැබී ඇති අතර විශ්‍රාම අනුමැතිය ඉල්ලීමට අදාළ ලිපි ලේඛන ඉදිරිපත් කිරීමේ අවස්ථාවේදී වැරදිකරුවෙකු ලෙස හඳුනාගෙන නොමැති බැවින්, විශ්‍රාම ගන්වන අවස්ථාවේදී කිසිඳු විනය ගැටලුවක් නොපැවතුණු බැවින් නිලධාරියා විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 2 හා 12 වගන්තිය අනුව විශ්‍රාම ගැන්වීමේ අවශ්‍යතාවයක් නොපැවති බව නිරීක්ෂණය විය. | අලාභයට වගකිව යුතු විශ්‍රාම නිලධාරීයා ගෙන් අයකර ගැනීමට නිතී මගින් කටයුතු කළ යුතුය. |
| (උ) | 2021 වර්ෂයේදී කොම්ප්ට්‍රොලර් කාර්යාලය වෙත යවන ලද තොරතුරු අනුව දෙපාර්තමේන්තුවට අයත් දිස්ත්‍රික් කාර්යාල 07 ක ගොඩනැගිලි 18 ක් වර්ෂ 05 සිට වර්ෂ 15 දක්වා කාලයක සිට විනාශ වීම නිසා අභාවිතව පැවතිණි. | දිස්ත්‍රික්ක 07 ක ගොඩනැගිලි 18 ක හානිවීම් නිසා භාවිතයට ගත නොහැකි ගොඩනැගිලි පුනරුත්ථාපන වැය විෂය යටතේ ප්‍රමාණවත් ප්‍රතිපාදන නොපැවතීම හේතුවෙන් එම ගොඩනැගිලි මෙතෙක් පිළිසකර කර ගැනීමට හැකියාවක් ලැබී නොමැත. | ප්‍රයෝජනයට නොගන්නා ගොඩනැගිලි උපයෝජනයට, අලුත්වැඩියාවට හෝ වෙනත් රාජ්‍ය දෙපාර්තමේන්තුවකට පවරා දීමට පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (උ) | දෙපාර්තමේන්තුවට අයත් වාහන හා නාරාහේන්පිට යන්ත්‍ර කොටස් ඇති ගබඩාව 2020, 2021 හා සමාලෝචිත වර්ෂය සඳහා සමීක්ෂණය කර නොතිබුණි. | දෙපාර්තමේන්තු වාහන සමීක්ෂණය සහ නාරාහේන්පිට යන්ත්‍ර කොටස් ඇති ගබඩාව සමීක්ෂණය මෙම වර්ෂයේදී සිදු කරන බව දන්වා සිටිමි. | වාහන හා යන්ත්‍ර කොටස් ඇති ගබඩාව සමීක්ෂණය කළ යුතුය. |

## 4. මානව සම්පත් කළමනාකරණය

### 4.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, සත්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට දෙපාර්තමේන්තුවේ අනුමත සේවක සංඛ්‍යාව 19,790 ක් වූ අතර තනතුරු 36 ක් සඳහා මුළු පුරප්පාඩු සංඛ්‍යාව 5,196 ක් විය. | අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ ඒ යටතේ වන සියලුම ආයතනවල ප්‍රාථමික සේවා ගණයේ සියලු පුරප්පාඩු සඳහා බඳවාගැනීම් නැවත දැනුම්දෙන තුරු අත්හිටුවීමට අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී තීරණය කර ඇත. එසේම අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ ඒ යටතේ වන සියලුම ආයතනවල සේවක බඳවාගැනීම් සඳහා මූලික කටයුතු සිදුකර තිබුණද මෙතෙක් පත්වීම් සිදුකර නොමැති තනතුරු සඳහා බඳවාගැනීම් කල්තබන ලෙස දන්වා ඇත. එම නිසා බහුකාර්ය සහායක තනතුරුවලින් එම පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් අවසර ඉල්ලා ඇත. ඒ අනුව ගොවිජන සංවර්ධන නිලධාරී තනතුරු 91 ක් පිරවීම සඳහා අනුමැතිය ලබාදී ඇත. ඒ අනුව සුදුසුකම් ලත් තරඟ කරුවන්ගේ සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව නිලධාරීන් 34 ක් ගොවිජන සංවර්ධන නිලධාරී II ශ්‍රේණියට බඳවාගන්නා ලදි. එසේම කාර්මික නිලධාරී (සිවිල්) 18 ක්, කාර්මික නිලධාරී (යාන්ත්‍රික) 05 ක් තාක්ෂණ සහායක නිලධාරීන් 17 ක් බඳවාගැනීමට අනුමැතිය හිමිවිය.<br>ඒ අනුව විවෘත ලිඛිත තරඟ විභාගයේ ප්‍රතිඵල අනුව සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල මත කාර්මික නිලධාරී (සිවිල්) 11 ක්, කාර්මික නිලධාරී (යාන්ත්‍රික) 01 ක් තාක්ෂණ සහායක නිලධාරීන් 15 ක් බඳවාගැනීමේ කටයුතු මේ වන සිදුකරමින් පවතී. | අත්‍යාවශ්‍ය තනතුරු සඳහා බඳවා ගත යුතුය. නොඑසේ නම් සේවක සංඛ්‍යාව සංශෝධනය කළ යුතුය. |
| (ආ) | 2022 වර්ෂයේදී දිස්ත්‍රික් කාර්යාල 16 ක කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර තනතුරුවල වැඩ බලන පත්වීම් 1,628 ක් වූ අතර එයින් වැඩ බලන පත්වීම් 209 ක් වෙනුවෙන් අමාත්‍යාංශ අනුමැතිය ලැබී නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | වැඩ බලන පත්වීම් සඳහා අමාත්‍යාංශ අනුමැතිය ලබා ගත යුතුය. |